ඉන්දියානු මහ **කොමසාරිස්** කාර්යාලය
**කොළඹ**

පුවත්පත් නිවේ**දනය**

<u>**ආයෝජන** සබඳතා ප්‍රවර්ධනය කරමින් දකුණු ගුජරාත් වාණිජ සහ කර්මාන්ත මණ්ඩල නිය**ෝජිත** පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරයක</u>

දකුණු ගුජරාත් වාණිජ සහ කර්මාන්ත මණ්ඩලයේ දස දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් 2024 නොවැම්බර් 24 වන දින සිට 29 වන දින දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වේ. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන මෙම නියෝජිත පිරිසේ සංචාරයේ අරමුණ වන්නේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සහ කර්මාන්ත සබඳතා ශක්තිමත් කිරීමයි. මෙම නියෝජිත පිරිස කොළඹ, මහනුවර සහ නුවර එළිය යන ප්‍රදේශයන්හි සංචාරය කරනු ඇත.

2. මෙම නියෝජිත පිරිස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ වෙළඳ සහ ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය උදෙසා කිරීම සංවිධානය කරනු ලබන “Voyage Sri Lanka” වැඩසටහන සඳහා සහභාගී වනු ඇත. එසේම ඔවුහු අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ නිලධාරීන් මෙන්ම ලංකා වාණිජ මණ්ඩලයේ සහ ඉන්දු ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩලයේ නිලධාරීන් ද හමු වනු ඇත. මෙම නියෝජිත පිරිස කැපිටල් මහරාජා සමූහය වැනි ප්‍රමුඛ පෙළේ සමාගම් ද වෙනත් පාර්ශවකරුවන් ද හමු වීමට සැලසුම් කර ඇත.

3. මෙම නියෝජිත පිරිසේ තවත් ප්‍රමුඛ කාර්යයක් වන්නේ 2025 ජනවාරි 25-27 දක්වා ගුජරාටයේ සූරත් හි පැවැත්වීමට නියමිත ග්ලෝබල් විලේජ් 2025 ජාත්‍යන්තර ප්‍රදර්ශනය ප්‍රවර්ධනය කිරීමයි. විවිධ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වීමට සහ සහයෝගීතාවයන් ගොඩනඟා ගැනීම සඳහා නව මාවත් සොයා ගැනීම සඳහා මෙය මාහැඟි වේදිකාවක් වනු ඇත.

4. මෙම සංචාරය ඉන්දියාව පුරා විහිදී තිබෙන ව්‍යාපාර මණ්ඩල ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ප්‍රජාව සමඟ සම්බන්ධ කිරීම සඳහා ගනු ලබන මුලපිරීම් මාලාවක පළමු වැන්නයි. මෙය දෙරට අතර ආර්ථික හවුල්කාරිත්වය තවදුරටත් ශක්තිමත් කරමින් ආයෝජන සහ අන්‍යෝන්‍ය වර්ධනය සහ සංවර්ධනය සඳහා දොරටු විවර කරනු ඇත.

***

**කොළඹ**
***2024 නොවැම්බර් 25***